IMMIGRATION
ADVISERS AUTHORITY

# නව සීලන්තයට ඔබගේ මාර්ගෝපදේශය බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන්

බැහැරවීමක් නොමැති නම්, නව සීලන්තය තුළ හෝ ඉන් පිටත නව සීලන්ත සංක්‍රමණ උපදේශනය ලබාදෙන ඕනෑම පුද්ගලයෙකු, සංක්‍රමණ උපදේශක අධිකාරියෙන් බලපත්‍ර ලබාගෙන සිටිය යුතුය.

## බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයෙකු භාවිතා කිරීමට හේතුව

ඔබට සංක්‍රමණ උපදේශනය අවශ්‍ය නම්, බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන්ට විශේෂඥ දැනුම ඇත. ඔවුන් නිපුණතා සපුරා ඇති අතර වෘත්තීයචර්යා ධර්ම සංග්‍රහය අනුගමනය කරයි.

### වෘත්තීය චර්යා ධර්ම සංග්‍රහයට බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන් අවශ්‍ය වන්නේ:

› අවංක, වෘත්තීයමය සහ ගෞරවනීය වීම
› ඔවුන් ඔබට ලබාදෙන සේවාවන් සහ ඒවා සඳහා ඔබට වැය විය යුතු මුදල් පැහැදිලිව සඳහන් වන ලිඛිත ගිවිසුමකට ඔබ සමඟ පිවිසීම
› ඔබට අඛණ්ඩ කාලෝචිත යාවත්කාලීන තොරතුරු ලබාදීම
› යුක්තිගරුක සහ සාධාරණ ගාස්තු අය කිරීම.

### බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන්ට ඔබට උපකාර කළ හැකිය:

› ඔබට ඇති වීසා බලපත්‍ර විකල්ප පරීක්ෂා කර නිවැරදි වීසා බලපත්‍රය තේරීම
› ඔබගේ වීසා අයදුම්පත සකස් කිරීම.
› නව සීලන්තයේ පදිංචි කරවීම
› ප්‍රතික්ෂේප කරන ලද වීසා බලපත්‍රයක් අභියාචනා කළ හැකිද යන්න තක්සේරු කරන්න
› ඔබ නව සීලන්තයේ නීතිවිරෝධී ලෙස සිටින අවස්ථාවක ඔබට තිබිය හැකි විකල්ප තක්සේරු කරන්න.

### ගාස්තු සහ සේවාවන්

බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන්ගේ විශේෂඥතාව, ඔවුන් අය කරන ගාස්තු සහ ඔවුන් ලබාදෙන සේවාවේ ගුණාත්මක මට්ටම වෙනස් විය හැක. ඔබගේ අවශ්‍යතා සඳහා වඩාත්ම ගැළපෙන උපදේශකයා තෝරා ගැනීමට පෙර, ඔබට උපදේශකයන් කිහිප දෙනෙකු සමඟ කතා කිරීමට ඔබ අවශ්‍ය විය හැකිය.

**නිපුණතා ප්රමිතීන් ප්‍රමිතීන්**
iaa.govt.nz/for-advisers/competency-standards

**චර්යා ධර්ම සංග්‍රහය**
iaa.govt.nz/for-advisers/code-of-conduct

## බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන්

### බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයෙකු සොයාගන්න

සංක්‍රමණ උපදේශක අධිකාරිය ඔබට පහසු වන පරිදි භාවිත කළ හැකි මාර්ගගත ලියාපදිංචි ලේඛනයක් පවත්වාගෙන යයි, ඒ මගින් ඔබට පහත දේ කිරීමට ඉඩ ලබාදෙයි:

› උපදේශකයෙකු සොයා ගන්න
› උපදේශකයෙකුගේ සම්බන්ධතා තොරතුරු බැලීම
› උපදේශකයෙකුගේ බලපත්‍ර ඉතිහාසය බැලීම.

බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයෙකු සොයා ගන්න: **iaa.govt.nz**




ඩිජිටල් බලපත්‍ර කාඩ්පත

### ඔබගේ සංක්‍රමණ උපදේශකයාට වත්මන් බලපත්‍රයක් තිබේදැයි පරීක්ෂා කරන්න

සමාගම්වලට බලපත්‍ර ලබා දිය නොහැක, පුද්ගලයන්ට පමණක් බලපත්‍ර ලබා ගත හැකිය. සංක්‍රමණ උපදේශක බලපත්‍ර එක් වසරක් සඳහා වලංගු වේ. උපදේශකයෙකුට වත්මන් බලපත්‍රයක් තිබේදැයි පරීක්ෂා කිරීමට, ඔබට කළ හැක්කේ:

› බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයන්ගේ මාර්ගගත ලියාපදිංචි ලේඛනයේ ඔබගේ උපදේශකයාගේ නම සෙවීමෙන්, ඔවුන්ගේ පොදු පැතිකඩය සොයාගන්න.
› ඔබගේ උපදේශකයාගේ ඩිජිටල් බලපත්‍ර සහතිකය බැලීමට ඉල්ලා සිටින්න — එහි QR කේතය ස්කෑන් කිරීමෙන්, සහතිකයේ සත්‍යතාව තහවුරු කරගත හැකි අතර එය ඔබ මාර්ගගත ලියාපදිංචි ලේඛනයේ ඔවුන්ගේ පොදු පැතිකඩ වෙත ගෙන යනු ඇත.

අපි නිකුත් කරන්නේ ඩිජිටල් බලපත්‍ර සහතික පමණි.

## බැහැර කරනු ලැබූ පුද්ගලයන්

බැහැර කරනු ලැබූ පුද්ගලයන්ට ඔබට සංක්‍රමණ උපදෙස් ලබාදීමට බලපත්‍රයක් තිබීම අවශ්‍ය නොවේ. බැහැර කරනු ලැබූ පුද්ගලයන් කිහිප දෙනෙකු වන්නේ:

### නව සීලන්ත නීතිඥයන්

නව සීලන්ත නීතිඥයන්ට නව සීලන්ත නීති සංගමය මගින් නිකුත් කළ වත්මන් වෘත්තීය ප්‍රායෝගික සහතිකයක් තිබේනම්, බලපත්‍රයක් නොමැතිව සංක්‍රමණ උපදෙස් ලබාදිය හැක.

නීතිඥයෙකු සොයාගැනීමට පිවිසෙන්න:**lawsociety.org.nz**

### විදේශීය ශිෂ්‍ය වීසා උපදේශකයන්

නවසීලන්තයෙන් පිටත සිටින පුද්ගලයන්ට බලපත්‍රයක් නොමැතිව ශිෂ්‍ය වීසා සඳහා සංක්‍රමණ උපදෙස් ලබාදිය හැක. කෙසේ වෙතත්, වෙනත් ඕනෑම කිසිදු වීසා වර්ගයක් සඳහා සංක්‍රමණ උපදෙස් ලබාදීමට ඔවුන්ට (බැහැර කරනු ලැබූ නොවේ නම්) බලපත්‍රයක් තිබිය යුතුය.

### නව සීලන්ත සංක්‍රමණ

නව සීලන්ත රජයේ නිල දෙපාර්තමේන්තුවක් වන සංක්‍රමණ නව සීලන්තයේ සහාය ඇතිව ඔබට ඔබේම නව සීලන්ත වීසා බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

පිවිසෙන්න: **immigration.govt.nz**

බැහැර කරනු ලැබූ පුද්ගලයන්ගේ සම්පූර්ණ ලැයිස්තුව සඳහා පිවිසෙන්න:

**iaa.govt.nz/for-migrants/who-can-give-advice**

## සංක්‍රමණ උපදේශක අධිකාරිය සමඟ සම්බන්ධ වන්න

info@iaa.govt.nz

0508 422 422 (නවසීලන්ත යේ සිට නොමිලේ)

+64 9 925 3838 (නවසීලන්තයෙන් පිටත)

www.iaa.govt.nz

## බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයෙකු සම්බන්ධව පැමිණිලි කිරීම

iaa.govt.nz/about-us/make-a-complaint/licensed-adviser-complaints/

## බලපත්‍ර රහිත පුද්ගලයෙකු පිළිබඳව පැමිණිලි කිරීම

iaa.govt.nz/about-us/make-a-complaint/unlicensed-adviser-complaints/

## බලපත්‍ර නොමැති සහ/හෝ බැහැර කරනු ලැබූ නොවන පුද්ගලයෙකු භාවිතා කිරීමේ අවදානම්

### අවදානම්



බලපත්‍ර නොමැති සහ/හෝ බැහැර කරනු ලැබූ නොවන පුද්ගලයෙකු භාවිතා කිරීමේ අවදනම්:

- ඔබගේ වීසා අයදුම්පත සංක්‍රමණ නව සීලන්තය (INZ) විසින් ආපසු එවනු ලැබේ. නීති විරෝධී ලෙස ක්‍රියා කරන බලපත්‍ර රහිත පුද්ගලයින්ගෙන් INZ අයදුම්පත් භාර නොගනී.
- බලපත්‍ර රහිත පුද්ගලයින් ඔබ හෝ INZ සමඟ අවංක නොවිය හැකිය. ඔබගේ වීසා බලපත්‍ර අයදුම්පත පිළිබඳ ව්‍යාජ හෝ නොමඟ යවන සුළු තොරතුරු සැපයීම අපරාධ වරදක් වන අතර වංකභාවය ඔබේ අනාගත වීසා බලපත්‍ර හෝ රැකියාවට බලපානු ඇත.
- බලපත්‍ර රහිත පුද්ගලයාට ආගමන විගමන දැනුමක් හෝ කුසලතා නොමැති බැවින් ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

### මතක තබා ගන්න

පහත සඳහන් ඕනෑම අයෙකුගෙන් ඈත් වී සිටින්න:

- ඔබගේ වීසා අයදුම්පතේ ඔවුන්ගේ නම ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කරයි නම්
- INZ හි පුද්ගලික සම්බන්ධතා ඇති බවට හිමිකම් කියයි නම්
- වීසා අයදුම්පතක් පුරවා අවසන් වීමට පෙර එය අත්සන් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටී නම්. ඔබට නොතේරෙන ලියවිල්ලකට ඔබ කිසි විටෙකත් අත්සන් නොකළ යුතුය.

## සංක්‍රමණ උපදේශක අධිකාරියේ කාර්යභාරය

සංක්‍රමණ උපදේශක අධිකාරිය සංක්‍රමණ උපදේශන ලබා ගන්නා අවශ්‍යතා ප්‍රවර්ධනය කර, ආරක්ෂා කරයි. බලපත්‍රයක් නොමැතිව යමෙකු සංක්‍රමණ උපදෙස් ලබා දෙන බව ඔබ දන්නේ නම් අප හා සම්බන්ධ වන්න. අපට තොරතුරු ලබා දීම ඔබේ සංක්‍රමණ තත්ත්වයට බලපාන්නේ නැත.

### අප විසින් ඔබට උදව් කළ හැකි දේ:

- බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයෙකු සොයා ගැනීමට
- බලපත්‍රලාභී සංක්‍රමණ උපදේශකයෙකු වන්නේ කෙසේදැයි තේරුම් ගැනීමට
- ඔබට දුර්වල සංක්‍රමණ උපදෙස් ලැබී ඇත්නම්.

### අපට පහත දේ කල නොහැක:

- සංක්‍රමණ උපදෙස් ලබාදීම
- එක් උපදේශකයෙකු අභිබවා තවත් උපදේශකයෙකු නිර්දේශ කිරීම.

